**ශීර්ෂය 219 – ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 219 - ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 දෙසැම්බර් 20 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂාකිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙනයාම, පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරිම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 2,799.81 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 2,310.16 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 489.65 ක් හෙවත් සියයට 17.49 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2015 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | |
| පුනරාවර්තන | 586.51 | 534.90 | 51.61 | 8.80 |
| මූලධන | 2,213.30 | 1,775.26 | 438.04 | 19.79 |
| **එකතුව** | **2,799.81** | **2,310.16** | **489.65** | 17.49 |

**2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 21901 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 9.40 | 9.03 | 5.70 | 8.00 | 33.00 | 26.71 |

**2.3 අග්‍රිම ගිණුම්**

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 7002/0000/00/0301/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. මිලියන 0.97 ක් විය.

**2.4 පොදු තැන්පත් ගිණුම**

දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 6000/0000/00/0015/0100/000 දරන පොදු තැන්පත් ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 194.39 ක් විය.

**2.5 විගණන නිරීක්ෂණය**

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ගිණුම් ඉදිරිපත් කිරීම**

දෙපාර්තමේන්තුව විසින් විෂය අංක 21901 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය 2016 අප්‍රේල් 30 දින හෝ ඊට පෙර විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත්, එම සැසඳුම් ප්‍රකාශය 2016 ජූලි 14 දින ඉදිරිපත් කර තිබුණි.

3.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම.

-----------------------------------------

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන සී.සී.10 ලේඛනය යාවත්කාලීන කර නොතිබුණු අතර,අනෙකුත් ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|---|
| (i) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ii) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛන | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (iii) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891 (1) |
| (iv) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454 (2) |
| (v) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 |
| (vi) | වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647 |
| (vii) | සී සී ලේඛනය 10, ණය ගැති ලේඛනය, ණයහිමි ලේඛනය හා පාලන ගිණුම | 1994 අගෝස්තු 10 දිනැති අංක 90 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය |

3.3 විගණන සාක්ෂි නොවීම

----------------------------

වැය විෂයයන් 03 යටතේ, ක්‍රීඩා පිටි සංවර්ධනය හා උපකරණ මිලදී ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා රු.145,070,468 ප්‍රතිපාදන ලබා දී තිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් ඒ සඳහා රු.122,987,503 ක් වැය කර තිබුණි. එම වියදමට අදාළ ව්‍යාපෘති හා වියදම් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එසේම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පසුවිපරම් කටයුතුද සිදු කර නොතිබුණි.

3.4 අග්‍රිම ගිණුම්

------------

දෙපාර්තමේන්තුව විසින් 2016 අප්‍රේල් 30 දින වන විට රු. 981,414 ක අග්‍රිම ශේෂය පියවා නොතිබුණි. ඉන් එකතුව රු. 20,000 ක් වූ ශේෂ 2014 වර්ෂයේ සිට පැවත එමින් තිබුණි.

3.5 පොදු තැන්පත් ගිණුම

----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු. 58,437,363 ක් වූ තැන්පතු 85 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) 2015 ජුනි 24 දිනැති අංක 243/2015 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව නව තැන්පතු කාණ්ඩ යටතේ ගිණුම් ගත කළ යුතු වුවද, රු. 194,389,992 ක තැන්පතු ශේෂ සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.

(ඇ) කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාර අර්ධ වාර්ෂික ලැයිස්තු පිළියෙල කර නොතිබුණි.

(ඇ) 2011 වර්ෂයේ සිට 2014 අගෝස්තු මාසය දක්වා කාලපරිච්ඡේදයට අදාළ රු. මිලියන 40 ක කොන්ත්‍රාත් තැන්පතුවලට අදාළව ආයතනයේ නම පමණක් කෙටියෙන් සඳහන් කර තිබූ අතර, ඒ සම්බන්ධව මුදල් රෙගුලාසි 569(2) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 3.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 21901 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 1,812,020 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 05 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) විශ්‍රාම ගිය නිලධාරින්ගෙන් අයවීමට තිබුණු රු.58,450 ක් හා සේවය අතහැර ගිය නිලධාරියකුගෙන් අයවීමට තිබුණු රු.1,700 ක් වශයෙන් එකතුව රු. 60,150 ක් වූ ණය ශේෂ වර්ෂ 5 කට වැඩි කාලයක සිට පැවැත එමින් තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම හිඟ හිටි ණය ශේෂ අයකර ගෙන නොතිබුණි.

(ඇ) සේවයේ නියුක්ත නිලධාරීන්ගේ ණය ශේෂ උපලේඛනයේ, 2015 දෙසැම්බර් 31 දිනට දැක්විය යුතු ණය ශේෂ රු. 119,543 ක් වැඩියෙන් හා රු.444,127 ක් අඩුවෙන් දක්වා තිබීම හේතුවෙන්, ගිණුමේ ශේෂය ශුද්ධ වශයෙන් රු. 324,584 කින් අඩුවෙන් දක්වා තිබුණි.

### 3.7 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

#### 3.7.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3 ඡේදය ප්‍රකාරව මුදල් වර්ෂයට අදාළව පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය, වාර්ෂික අයවැය පදනම් කර ගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම් සැලැස්ම හා එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමවුම් හා ප්‍රතිඵල, වාර්ෂික අක්මුදල් අවශ්‍යතා සැලැස්ම, වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සහ අභ්‍යන්තර විගණන සැලැස්ම ඇතුළත් කර නොතිබුණි.

**3.7.2 අභ්‍යන්තර විගණනය**

-----------------------

දෙපාර්තමේන්තුව සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් රු. මිලියන 2,799.81 ක ප්‍රතිපාදන සලසා තිබුණද, 2009 ජූනි 09 දිනැති අංක DMA/2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාර අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි. අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය විසින්ද දෙපාර්තමේන්තුවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

**3.8 වත්කම් කළමනාකරණය**

--------------------------

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

----------------------------------------

මාදම්පේ සේනානායක විද්‍යාලයේ ඉදිකළ රු. මිලියන 33 ක් වූ පිහිනුම් තටාකය හා වත්තේගම මඩුල්කැලේ ක්‍රීඩා සමාජය සඳහා ඉදිකළ රු. මිලියන 0.9 ක් වූ ටෙනිස් පිටිය පිළිවෙලින් වර්ෂ 04 ක් හා වර්ෂ 01 ක කාලයක් නිෂ්කාර්යව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය විය.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

----------------------------------------

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2016 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දිස්ත්‍රික් කාර්යාල 13 ක භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2017 ජූනි 20 දින වන විට ද විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**(ඇ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

-----------------------------------------

දෙපාර්තමේන්තුව විසින් 2012 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු මෝටර් වාහනයක් එම වර්ෂයේ සිට විධිමත් ලෙස පැවරීමකින් තොරව ක්‍රීඩා අමාත්‍යාංශය වෙත මුදාහැර තිබුණි.

**(ඈ) වෙනත් ආයතන සතු වාහන අවිධිමත්ව පරිහරණය කිරීම**

--------------------------------------------------------------

ක්‍රීඩා අමාත්‍යාංශය සතුව තිබුණු මෝටර් වාහන 03 ක් විධිමත් ලෙස පවරා ගැනීමකින් තොරව වර්ෂ 01 ක සිට වර්ෂ 10 ක් දක්වා කාල පරාසයක සිට දෙපාර්තමේන්තුව විසින් භාවිතයට ගෙන තිබුණි.

## 3.9 අනුකූල නොවීම්

### නීති , රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති , රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| **(අ) ව්‍යවස්ථාපිත විධිවිධාන** | |
| (i) 1993 අංක 47 දරන ක්‍රීඩා (සංශෝධන) පනතින් සංශෝධිත 1975 අංක 25 දරන ක්‍රීඩා පනතේ 21අ(2) වගන්තිය. | සෑම සංගමයකම විගණිත මූල්‍ය ප්‍රකාශන, ඊට පසු වර්ෂයේ මාර්තු 31 දිනට පෙර, මහා සභා රැස්වීමට ඉදිරිපත් කළ යුතුව තිබුණි. එසේ විගණනය සඳහා 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාළව මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර නොතිබුණද, ජාතික ක්‍රීඩා සංගම් 08 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 26.32 ක් ලබාදී තිබුණි. |
| (ii) 2013 ජනවාරි 15 දිනැති අංක 1793/3 දරන ක්‍රීඩා සංගම් නියෝගවල නියෝගවල අංක 42 | යම් ජාතික සංගමයක ධූරයකට පත්කළ නිලධාරියෙකු හෝ කමිටුවේ සමාජිකයෙකු සිය ධූරය දැරීම අවසන් වන දින සිට දින දාහතරක කාලයක් ඇතුළත තමාගේ සන්තකයේ පවතින ජාතික සංගමයට අයත් දේපළ, වෙනත් යම් නිලධරයකු වෙත හෝ කමිටු සාමාජිකයකු වෙත හෝ ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත හෝ භාර දිය යුතු වුවද, එසේ ධූරය අවසන් කළ නිලධාරීන් හා කමිටු සාමාජිකයින් විසින් එසේ කටයුතු කර නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 880 | ඇප තැබිය යුතු රජයේ නිලධාරීන් ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 1646 | දෙපාර්තමේන්තුව සතු සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා නියමිත කාලවකවානුව තුළ විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි |

## 3.10 දේශීය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

---

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

### (අ) ව්‍යාපෘති ආරම්භ කර නොතිබීම

---

2014 වර්ෂයේ රු.9,442,647 ක් වූ ව්‍යාපෘති 09 ක් ද, 2015 වර්ෂයේදී, රු.41,445,161 ක්වූ ව්‍යාපෘති 20 ක්ද, වශයෙන් එකතුව රු.50,887,808 ක් වූ ව්‍යාපෘති 29 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ආරම්භ කර නොතිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 වර්ෂයේ ආරම්භ කළ යුතුව තිබූ ඇස්තමේන්තුගත පිරිවැය රු.9,442,647 ක් වූ ව්‍යාපෘති 10 ක් නිම කළ බව සඳහන් කර රු. 10,660,715 ක් වටිනා චෙක්පතක් ලියා මාස 13 ක කාලයක් අත රඳවා ගැනීමෙන් පසුව ආදායමට ගෙන තිබුණි.

(ii) ඇස්තමේන්තුගත පිරිවැය රු.35,540,161 ක් වූ ව්‍යාපෘති 17 ක් ආරම්භ කර නොතිබුණි. එම ව්‍යාපෘති ආරම්භ නොකිරීම සම්බන්ධව තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(iii) පිහිටීම අනුව ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීම ඵලදායි නොවන බව හේතු වශයෙන් දක්වා ඇස්තමේන්තුගත පිරිවැය වූ රු.1,938,000 ක ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි.

(iv) ඉඩම ප්‍රමාණවත් නොවීම හා භූමියේ මායිම පිළිබඳව ගැටළුකාරී තත්ත්වයක් පවතින බවට කරුණු සඳහන් කර ඇස්තමේන්තුගත පිරිවැය රු. 3,967,000 ක් වූ ව්‍යාපෘති 02 ක් ආරම්භ කර නොතිබුණි.

### (ආ) ව්‍යාපෘති නිම නොකර අත්හැරීම

---

දෙපාර්තමේන්තුව විසින් ඇස්තමේන්තුගත පිරිවැය රු. 9,939,715 ක් වූ හාවාඑළිය පොදු ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2015 දෙසැම්බර් 31 දින වන විට රු. 80,000 ක් වියදම් කර තිබුණි. නුවරඑළිය මහ නගර සභාව, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට එකඟ නොවීම හේතුවෙන් එම ව්‍යාපෘතිය නිම නොකර අතහැර තිබුණි.

### (ඇ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

---

ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 2,738 ක් වූ ව්‍යාපෘති 27 ක් 2015 දෙසැම්බර් 31 දින වන විට මාස 19 ක සිට මාස 57 ක් දක්වා කාල පරාසයක් පමා කර තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම ව්‍යාපෘති නිම කිරීමට නොහැකි වී තිබුණි.

**3.11** **කාර්යසාධනය**

**---------------**

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ)** **කාර්යසාධන වාර්තා පිළියෙල කිරීම.**

**------------------------------------**

කාර්යසාධන වාර්තා පිළියෙල කර නොතිබූ බැවින් ඉලක්කයන් සමඟ තථ්‍ය කාර්යසාධනය සැසඳීමට නොහැකි වී තිබුණි.

**(ආ)** **ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ කාර්යයන්**

**-----------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විගණනයට ඉදිරිපත් කරන ලද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත්ව නොතිබුණු ඉන් පරිබාහිරව වූ ව්‍යාපෘති 2015 වර්ෂයේදී ආරම්භ කර තිබුණි.

(ii) 2011 ජූලි 6 දිනැති අංක 2011/14 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයක්, දිග මීටර් 50 ක පිහිනුම් තටාංගනයකින්ද, සමන්විත විය යුතුව තිබුණි. ඊට පටහැනිව දිස්ත්‍රික් ක්‍රීඩා සංකිර්ණ 14 ක, මීටර් 25 ක් වූ පිහිනුම් තටාක ඉදිකිරීමට කටයුතු කර තිබුණි.

(iii)

**3.12** **බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

**-----------------------------------**

**ගැලපුම් කළ යුතු ශේෂ**

**-----------------------**

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2015 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශයේ දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව එසේ ගැලපුම් කළ යුතු ගනුදෙනු පිළිබඳව අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

| | **ගැලපුම් පිළිබඳ විස්තරය** | **කාල විශ්ලේෂණය** | | **එකතුව** |
|---|---|---|---|---|
| | | **මාස 6 කට වැඩි වර්ෂ 01 කට අඩු** | **වර්ෂ 01 කට වැඩි වර්ෂ 03 කට අඩු** | |
| | | **රු.** | **රු.** | |
| (i) | උපලබ්ධි නොවූ තැන්පතු | - | 20,910 | 20,910 |
| (ii) | නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් | 10,790,819 | 9,587,644 | 20,378,463 |
| (iii) | හඳුනා නොගත් හර | 472,517 | 21,858,944 | 22,331,461 |
| (iv) | හඳුනා නොගත් බැර | 53,395 | 802,754 | 856,149 |

## 3.13 අවිධිමත් ගනුදෙනු

--------------------

**රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ක්‍රියා පරිපාටියෙන් බැහැරවීම**

---------------------------------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පරිපාටියෙන් බැහැරවීම් නිරීක්ෂණය විය.

**(අ) ශක්ති වර්ධන මධ්‍යස්ථානය සඳහා උපකරණ මිලදී ගැනීම.**

-------------------------------------------------------------

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශය ප්‍රකාරව භාණ්ඩ හා උපදේශක නොවන සේවා සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවෙහි සීමාව රු. මිලියන 10 ක් වුවද, ඊට පටහැනිව රු. මිලියන 23.64 ක භාණ්ඩ මිලදී ගැනීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව අනුමැතිය ලබා දී තිබුණි. අදාළ ලංසු ලියවිලි ද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ) මන්නාරම දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීම.**

-----------------------------------------------

මන්නාරම දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ ව්‍යාපෘතියට ඇතුළත් වූ පිහිනුම් තටාකය, ගෘහස්ථ ක්‍රීඩාංගනය හා ප්‍රේක්ෂකාගාරය හා මීටර් 400 ධාවන පථය යන ඉදිකිරීම් සඳහා මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 204.81 ක් විය. මෙම එක් එක් ඉදිකිරීම් කාර්යයන් සඳහා වෙන් වශයෙන් ලංසු කැඳවා 2015 අගෝස්තු 03 දින කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට මෙම කොන්ත්‍රාත් 03 වෙනුවෙන් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් වශයෙන් රු.මිලියන 45.96 ක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ව්‍යාපෘතිය බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් ක්‍රියාත්මක කළ යුතු මට්ටමේ කටයුතු ඉටු කර ඇති බවට සනාථ කිරීමක් කර නොතිබුණි.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.10 මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු වලංගු කාලය තුළදී කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා දින 90 ක කාලයක් තුළ කටයුතු කළ යුතු වුවද, යථෝක්ත ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට එම කාලය දින 68 කින් ඉක්මවා දින 158 ක පමණ කාලයක් ගත කර තිබුණි.

(iii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.5.1 මාර්ගෝපදේශය ප්‍රකාරව අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව අදාළ කොන්ත්‍රාත්තුව ලංසුකරුවන් වෙත ප්‍රදානය කිරීමට ප්‍රථම අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත දැනුම් දීමෙන් පසු සුදුසු ලංසුකරු තෝරා ගත් බව සහ ඔහුට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට ඇති අදහස සතියක් ඇතුළත සෙසු ලංසුකරුවන් වෙත දැනුම් දිය යුතුව තිබුණි. එම දැනුම් දීමෙන් පසු අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුවේ තීරණයට එරෙහිව කොන්ත්‍රාත්කරු තෝරා ගැනීම පිළිබඳව අනෙක් ලංසුකරුවන්ගේ නියෝජන ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස දැනුම් දිය යුතුව තිබුණි. යථෝක්ත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේදී ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(iv) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.7.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසුවේ වලංගු කාලය ඇතුළත සහ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම පිළිබඳ අවසාන තීරණය ගනු ලැබූ විගස ප්‍රතිග්‍රාහක ලිපිය නිකුත් කළ යුතු වුවද, යථෝක්ත කොන්ත්‍රාත්තුවට අදාළව කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේදී, දින 111 ක් ප්‍රමාද කර ප්‍රතිග්‍රාහක ලිපිය නිකුත් කර තිබුණි.

(v) 2011 ජූලි 6 දිනැති අංක 2011/14 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව මන්නාරම දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ ව්‍යාපෘතිය ඉදිකිරීම විගණන දින වූ 2016 නොවැම්බර් 30 දින වන විටද නිම කර නොතිබූ නිසා අපේක්ෂිත අරමුණ ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.

**3.14 කළමනාකරණ දුර්වලතා**

**--------------------------**

දෙපාර්තමේන්තුවේ ගනුදෙනු සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් කළමනාකරණ දුර්වලතා නිරීක්ෂණය විය.

**(අ) ක්‍රීඩා සංගම් නියාමනය**

**-----------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ජාතික ක්‍රීඩා සංගම්වල කාර්යසාධනය හා ප්‍රතිපාදන ලබාදිය යුතු ක්ෂේත්‍රයන් නිශ්චිතව හඳුනා ගැනීමෙන් තොරව ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂයේදී රු. මිලියන 88.48 ක් ක්‍රීඩා සංගම් වෙත ලබාදී තිබුණි. 2013 ජනවාරි 15 දිනැති අංක 1793/3 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කරන ලද 2013 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝගයන්හි 35 වන වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයෙන් ප්‍රදාන ලබා ගැනීම අපේක්ෂා කරනු ලබන යම් ජාතික ක්‍රීඩා සංගමයක් විසින් සකස් කරනු ලබන වාර්ෂික අයවැය ලේඛනය තුළ අදාළ ප්‍රදානයන් හා ඊට අදාළ උපයෝජනයන් අන්තර්ගතකර තිබේද යන්න විශ්ලේෂණාත්මක ඇගයීමකට ලක්කිරීමකින් තොරව ප්‍රතිපාදන ලබා දී තිබුණි.

(ii) 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ක්‍රීඩා සංගම් 08 ක් විසින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණ අතර, එම සංගම් වෙත රු. මිලියන 68.66 ක ප්‍රදානයන් ලබාදී තිබුණි. එසේ ලබා දුන් ප්‍රදාන විධිමත් පරිදි භාවිතා කර තිබේද යන්න තහවුරු කර ගැනීමට පසු විපරම් කර නොතිබුණි.

(iii) 2012 මැයි 16 දිනැති අංක 1758/23 දරන ගැසට් නිවේදනයේ 35 ඡේදය ප්‍රකාරව ක්‍රීඩා සංවර්ධනය සඳහා අනුග්‍රාහකත්වය ලබා දෙන පෞද්ගලික ආයතන සඳහා බදුසහන ගැනීමට අවස්ථාව සලසා තිබුණි. නමුත් ක්‍රීඩා සංගම් සඳහා අනුග්‍රාහකත්වය පෞද්ගලික අංශයෙන් ලබා ගැනීම සඳහා කිසිදු වැඩ පිළිවෙලක් දෙපාර්තමේන්තුව විසින් සිදු කර නොතිබුණි. මේ නිසා ක්‍රීඩා සංගම් වල කටයුතු රජයේ ප්‍රතිපාදන මුදල් වලින් පමණක් ඉටු කිරීමට සිදු වී තිබුණි.

**(ආ) ක්‍රීඩා පිටි හා ක්‍රීඩා සංකීර්ණ ඉදි කිරීම.**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් කර නොතිබුණු ව්‍යාපෘති 36 ක් ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 78.87 ක ප්‍රතිපාදන සලසා තිබුණි. කාර්යසාධන වාර්තාව අනුව එම ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතියක් වාර්තා කර නොතිබුණි.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදනයේ එක් අරමුණක් වන නිසි කලට වේලාවට ගුණාත්මකභාවයෙන් යුතුව වැඩ ඉටු කර ගැනීම සිදුකළ යුතු වුවද, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මීට පෙර පිරිනමන ලද කොන්ත්‍රාත්තුවක් දෝෂ සහිතව ප්‍රමාද කර නිම කළ කොන්ත්‍රාත්කරුවෙකු වෙත ඇස්තමේන්තුගත මුදල වූ රු. මිලියන 208 ක් වූ පිහිනුම් තටාක 06 ක්, රු. මිලියන 91 ක් වූ ගෘහස්ථ ක්‍රීඩාංගනයක් සහ රු. මිලියන 54 ක් වූ ධාවන පථයක් ඉදිකිරීම වශයෙන් ඉදිකිරීම් කටයුතු 38 ක කොන්ත්‍රාත්තු පිරිනමා තිබුණි.

**3.15 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 14 | 08 | 06 | |
| (ii) | තෘතියික මට්ටම | 04 | 01 | 03 | |
| (iii) | ද්විතියික මට්ටම | 254 | 186 | 68 | |
| (iv) | ප්‍රාථමික මට්ටම | 52 | 43 | 09 | |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | - | 02 | - | 02 |
| | **එකතුව** | **324** | **240** | **86** | **02** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විධිමත් අනුමැතියක් ලබා නොගෙන අනියම් තනතුරු දෙකක් සඳහා සේවකයින් දෙදෙනකු බඳවා ගෙන තිබුණි.